## 248 හෙම්බල ආත්මයේ

හෙම්බල ආත්මයේ මාගේ
ගයව පසස දෙවියන් වරුණේ
ආත්මයේ මුළුමතින් මගේ – පසසව් එතුමන්ගේ
හේලි හේලි නාමේ

ගුණ යහපත්කම් එතුමාණන් ගේ
අමතක නොකරවමම අත් බවේ
සම්දුන් හට තුති පුදා පුදා
පසසව එතුමන් ගයා ගයා

ඔබ'තින් සිදුවුණු වැරදි සියල්ල මැ
කමා කරන්නෝ එතුමාණෝ
ඔබ හැම ලෙඩ දුක් මුලිනුපුටා
සුව සලසන්නේ එතුමාණෝ

විපතට පත්වනු නොදෙමින් එතුමෝ
ජීවිතෙ ඔබගේ රැකැගන්නේ
වරප්‍රසාදේ කරුණා වේ
කිරුළින් ඔබෙ හිස පලඳන්නෝ

යහපත් දෙයින් මැ ඔබගේ ආසා
යහමින් එතුමෝ සපුරන්නෝ
රාජාලියකුගේ තටු වාගේ
එතුමෝ ඔබ තිරිහත් කරන්නෝ

කරුණා ගුණයෙන් උතුරා යන්නේ
අනුකම්පාවෙන් බර වන්නේ
කෝප සිතින් නැ කැළැඹෙන්නේ
දයාබරයි හද එතුමන්ගේ